ලංසු සඳහා ආරාධනාවයි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහනුවර

1. මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාස අලුත්වැඩියා කිරීම හා ගඟවට කෝරළයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ගැටඹේ සමෘද්ධි බැංකු ගොඩනැගිල්ලේ දෙවන අධියර ඉදිකිරීම් සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් සුදුසුකම්ලත් අසාධු ලේඛනගත නොවූ ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු ආරාධනා කරනු ලැබේ.

2. ලංසුකරුවන් තෝරා ගැනීමේදී මීට පෙර කර ඇති සාර්ථක ඉදිකිරීම් පිළිබඳව සැලකිල්ලට ගන්නා අතර ඒ පිළිබඳ විස්තර ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.ලංසුවට අදාල වැඩිමනත් විස්තර මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දුරකථන අංක 081-2233604 න් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී අමතා ලබාගත හැකිය.

3. ලංසු විස්තර www.Kandy.dist.gov.lk වෙබ් අඩවියේ "ප්‍රසම්පාදන" තීරුව මගින් තොරතුරු ලබාගත හැකි අතර ලංසු ලියවිලි සඳහා 2025.06.27 දින ප.ව.3 .00 දක්වා ගාස්තුව මුදලින් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් ගෙවා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ලංසු ලියවිලි ලබාගත හැකිය.

4. ලංසු ලියවිලිවල ඉල්ලා ඇති තාක්ෂණික මූල්‍ය හා අනෙකුත් සුදුසුකම් සහිත ලේඛනවල සහතික කළ පිටපත් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය.

5. නිසි පරිදි සම්පූරණ කරන ලද ලංසුපත් පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත හා අනුපිටපත වෙන් වෙන්ව නම් කර මුද්‍රා තබා එක කවරයක බහා 2025.06.30 දින පෙ.ව.10.00 හෝ ඊට පෙර ලැබෙන සේ මහනුවර දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ,මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කල හැකිය. ලංසුපත් ඉදිරිපත් කරන කවරයේ ඉහල වම් කෙලවර අදාල ලංසුවේ නම සඳහන් කළ යුතුය.

6. ප්‍රමාද වී ලැබෙන සහ නියමිත උපදෙස් අනුව ඉදිරිපත් නොකරන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැකුවකින් ලබාගත් පහත වගුවේ සඳහන් වටිනාකමින් හා ලංසු විවෘත කරන දින සිට වලංගු දින ගණනින් යුතු කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණ සහතිකයක් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් කරන තැන්පත් කිරීමක් සඳහා වූ ලදුපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. මෙම බැංකුව මගින් ලබාගන්නා ලංසු සුරක්ෂණ " මහනුවර දිස්ත්‍රික් ලේකම් " නමින් ලබාගෙන තිබීම අත්‍යාවශයවේ.

උපලේඛනයෙ

| අනු අංකය | කර්මාන්තය | පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන | අවශ්‍ය අවම CIDA ලියාපදංචිය | ලංසු සුරක්ෂණයේ වටිනාකම | | ලංසු සුරක්ෂණය සඳහා දින ගණන | ලංසු ලියවිලි ගාස්තුව ආපසු නොගෙවන |
|---|---|---|---|---|---|---|---|
| | | | | බැංකු සහතිකය රුපියල් | මුදලින් රුපියල් | | |
| 01 | ගැටඹේ සමෘද්ධි ප්‍රජාමුල බැංකු ගොඩනැගිල්ල ඉදිකිරීම අදියර 2 | 5.5 | C 8 | 55,000 | 55,000 | 2025.10.13 | 1800.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 02 | අංක 357 නවයාලතැන්න කටුගස්තොට නිල නිවාස අලුතුවැයා කිරිම | 1.69 | C 9 | 17,000 | 17,000 | 2025.09.15 | 800.00 |
| 03 | ගොර්ඩින් ආර්යා මාවතේ අංක 150/15A 150/19 හා අප්ලන්ඩිස් 15/20 නිල නිවාසවල බැම්ම අළුත්වැඩියා කිරිම. | 4.94 | C 8 | 49,500 | 49,500 | 2025.09.15 | 1500.00 |
| 04 | අංක 12/30,2 C හා 19/30 ධර්මාශෝක මාවතේ හා අරුප්පල නිල නිවාස අලුත්වැඩියා කිරිම. | 4.76 | C 8 | 49,500 | 49,500 | 2025.09.15 | 1500.00 |
| 05 | අංක 12/09,20/12 ආදාහනමලුව පාර නිල නිවාස අලුත්වැඩියා කිරිම. | 2.61 | C 9 | 26,500 | 26,500 | 2025.09.15 | 1000.00 |
| 06 | අංක 05වඩුගොඩපිටිය නිල නිවාස අලුත්වැඩියාව හා වඩුගොඩපිටිය නිවාස සංකිරණයේ වැට අලුත්වැඩියා කිරිම. | 2.31 | C 9 | 23,500 | 23,500 | 2025.09.15 | 1000.00 |
| 07 | අංක 387 පල්ලෙතලවින්න මිල්ලංග නින නිල නිවාස අලුත්වැඩියා කිරිම | 1.69 | C 9 | 17,000 | 17,000 | 2025.09.15 | 800.00 |
| 08 | අංක30/6,30/7,30/8 30/9 හා 30/10 ධර්මාශෝක මාවත නිවාස අලුත්වැඩියාව කිරිම | 8.01 | C 8 | 81,000 | 81,000 | 2025.10.13 | 3000.00 |
| 09 | අංක30/1,30/2,30/3 30/4 හා 30/5 ධර්මාශෝක මාවත නිවාස අලුත්වැඩියාව කිරිම | 10.41 | C 7 | 104,500 | 104,500 | 2025.10.13 | 3600.00 |

8.ලංසු භාර ගන්නා වේලාව පසු වූ වහාම විවෘත කරනු ලැබේ.එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට පැමිණ සහභාගි විය හැකිය.

09.ලද ලංසු අතරින් යෝග්‍ය ලංසුවක් පිළිගැනිම හෝ අසම්පූර්ණව ඉදිරිපත් කර ඇති ලංසුව ප්‍රතික්ෂේප කිරිමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර,ප්‍රසම්පාදන කමිටුවේ තිරණය අවසන් තිරණය වේ.

ඉන්දික උඩවත්ත
ප්‍රසම්පාදන කමිටුවේ සභාපති ,
දිස්ත්‍රික් ලේකම් /දිසාපති
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,මහනුවර

ඉන්දික උඩවත්ත
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
මහනුවර